1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2005.11.18 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.12.19 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පන්නිපිටිය, හයිලෙවල් පාරේ අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.05.06 වැනි දින පෙරවරු 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, වෙනිවැල්කොළ පාසල් මාවත පිහිටි වෙනිවැල්කොළ මූකලාන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩන්වල විසින් සැකසුණු 1995.07.26 සහ 1995.11.10 දිනයන් හා අංක 2135 දරන පිඹුරේ කැබලි අංක 6 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 15 ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

තවද, එකී අංක 2135 දරන පිඹුරේ කැබලි අංක ආර් 1, ආර් 2, ආර් 3, ආර් 4, ආර් 5, ආර් 6, ආර් 7, ආර් 8, සහ ආර් 9 යන බිම් කොටස් මතින් ඇති මාර්ග අයිතිය ද සමග සහ එකී පිඹුරේ කැබලි අංක ඩී 1, ඩී 2, ඩී 3, ඩී 4, ඩී 5 සහ ඩී 6 යන බිම් කොටස්

හරහා ගමන් ගන්නා වැසි ජලය හා අපද්‍රව්‍ය ගලා බසින කාණු පද්ධතියේ අයිතිය සමග වේ.

මෙම ඉඩම් කොටස කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන්. 255/93 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරි.*

2006 මාර්තු මස 10 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.
03-567/1

---

## මහජන බැංකුව-බොරැල්ල ශාඛාව

**1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මා වෙත පවරන ලද බලය පරිදි වෙන්දේසියේ විකිණීම**

**හොරණ ශ්‍රී ලංකා රබර් ප්‍රොඩක්ට්ස් එක්ස්පෝට් කෝපරේෂන් (ප්‍රයිවෙට්) ලිමිටඩ් දැවැන්ත දේපළ වෙන්දේසිය**

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ උඩුගහ පත්තුවේ හොරණ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත මිල්ලෑවේ පිහිටි "මිරිස්වත්ත එස්ටේට්" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ඩී. පියසිරි විසින් සාදන ලද 1996 මැයි මස 16 දාතම හා අංක 3113 දරන (LRC) අංක 99 සහ 35) පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කොට දක්වා ඇති අගනා සම්පූර්ණ ඉඩමේ බදු අයිතිය ( ප්‍රමාණයෙන් අ. 5, රූඩ් 0. පර්. 0 ක ඉඩම) මහජන බැංකුව විසින් මා වෙත පවරා ඇති බලය පරිදි ඉහත කී දේපළ මා විසින් දේපළ පිහිටි ස්ථානයේදී 2006 අප්‍රේල් 8 වැනිදා-සෙනසුරාදා පෙ. ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2004.09.24 දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2004.09.08 දින 'ඩේලිනිව්ස්' හා 'දිනමිණ' පුවපත්වල පල කරන ලද වෙන්දේසි යෝජනාවකට හා 2006.03.24 දින රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද විකුණුම් නිවේදනයට ද අවධානය යොමු කරන්න.

*ගෙවන පිළිවෙල* **:** සාර්ථක ගැණුම්කරු විසින් මිළ තීන්දු වහාම පහත සඳහන් ගාස්තු මුදලින් ගෙවිය යුතුය.

1. මිළ තීන්දු වූ වහාම ගැනුම් මිලෙන් 10% ;
2. පළාත් අධිකාරියේ අළෙවි බදු වශයෙන් 1% ;
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් (සියයට දෙකහමාරක්) ;
4. විකුණුම් පිරිවැය පිළිබඳ සමානුපාතික වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා.

5. ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූව) වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත කොළඹ 01, ආදිපාද වීදියේ අංක 11 මහජන බැංකුව, කලාපීය කාර්යාලයේ, (බස්නාහිර කලාප 01) සහකාර සමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය. දුරකථන 74-717008-09/ 2393678 හා 2435977 ඉහත සඳහන් කළ පරිදි එකී මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිළෙන් 10% (සියයට දහයක්) මුදල ආපසු නොගෙවීමටත් දේපළ නැවත විකිණීමටත් බැංකුවට අයිතිය ඇත.

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්,
විශේෂඥ වෙන්දේසිකරු, තක්සේරුකරු
සහ දේපල නියෝජිත.

381 1/1, ගාලු පාර,
කොළඹ 04.
දුරකථන අංක : 2591167, දුරකථන/ෆැක්ස් : 2584874, 2500838.
ක්ෂණික ඇමතුම් : 0722-250422./077-2250422.
03-566

---

## සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

ඩියවුඩ් තේ කර්මාන්ත ශාලාව නොහොත් ඩියවුඩ් ටී ෆැක්ටරි.

ගිණුම් අංක : 0020 1000 0966 සහ 0020 1000 0850.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.11.25 වැනි දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2005.01.28 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2005.01.08 වැනි දින "දිනමිණ" "තිනකරන් " සහ 2005.01.08 "ඩේලිනිව්ස්" යන පුවත්පත්වලද පළ කරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හත්කෝටි පහලොස් ලක්ෂ හැත්තෑ දෙදහස් හාරසිය අනූපහයි ශත අසූනවයක (රු. 7,15,72,495.89) මුදල සමග තවත් රුපියල් එක්කෝටි අනූදෙලක්ෂයක (රු. 1,92,00,000) මුදල සඳහා වසරකට සියයට දහනවය (19%) බැගින්ද, තවත් රුපියල් තුන්කෝටි හතලිස් හයලක්ෂ පනස් දහසක (රු. 3,46,50,000) මුදල සඳහා වසරකට සියයට දහනවය (19%) බැගින්ද තවත් රුපියල් තිස්හතර ලක්ෂ අනූදහසක (රු. 34,90,000) මුදල සඳහා වසරකට සියයට දහහතර (14%) බැගින්ද, 2004 සැප්තැම්බර් 16 වැනි දින සිට වෙන්දේසි දින තෙක් පොළී මුදල්ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩන්ස්ටන් කෙලාට් විසින් 2006.04.18 දින පෙ. ව. 10.30 ට හා 11.30 ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

පළමුව, සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළයේ උතුරු උඩපත්තුවේ, සුදගල පිහිටි "ඩියවුඩ්එස්ටේට් සහ ලකමුව" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. රාමක්‍රිෂ්නන් විසින් මැන සාදන ලද 2000 දෙසැම්බර් 06 දාතම හා අංක 8586 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 A වශයෙන් ලකුණු කොට දක්වා ඇති උතුරට : මලන්දාවල මූකලාන *නොහොත්* ලක්කමුවගේ කැලේ ද, නැගෙනහිරට : කුරුවිට සිට එරත්න දක්වා දිවෙන මාර්ගයද, දකුණට : කුරුවිට සිට එරත්න දක්වා දිවෙන මාර්ගය සහ, බටහිරට : වෙන්කළ කොටසින් පාරද මායිම් වන ප්‍රමාණයෙන් අක්කර දෙකයි පර්චස් දෙකක් (අ. 02, රූඩ් 0, පර්. 02) වන රත්නපුර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව A 541/240 හි ලියාපදිංචි කොට ඇති බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ ඉඩම් කොටස.

පහත දැක්වෙන ඉඩම්වල පූර්ණ නිදහස් අයිතිය හා ඒවා තුළින් මතින් හෝ මගින් විදුලි කේබල් විදුලි සංදේශ මාර්ග භාවිතා කිරීමේ අයිතියද සමගය.

ඉහත කී සුදගල පිහිටි "ඩියවුඩ් එස්ටේට්" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු සී. බී. අලවතුර විසින් සාදන ලද 1990 ජුනි 02 දාතම හා අංක 0598 දරන පිඹුරේ නිරූපිත ලොට් 8 වශයෙන් ලකුණු කොට දක්වා ඇති උතුරට : ප්‍රධාන මාර්ගය ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 1 ද, දකුණට : එකී පිඹුරේ ලොට් 09 සහ බටහිරට : එකී පිඹුරේ ලොට් 1 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් 26 (අක්. 0 රූඩ්. 0 පර්. 26) වන රත්නපුර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව A 730/206 හි ලියාපදිංචි කොට ඇති බෙදා වෙන්කොට සීමා නිර්නය කල මහපාරක් වන බිම් කොටස.

ඉහත කී සුදගල පිහිටි "ඩියවුඩ් එස්ටේට්" නමැති ඉඩමේ ඉහත කී අංක 0598 දරන පිඹුරේ නිරූපිත ලොට් 09 වශයෙන් ලකුණු කොට දක්වා ඇති උතුරට: එකී අංක 0598 පිඹුරේ ලොට් 08 ද, නැගෙනහිරට: ඩියවුඩ් එස්ටේට් (කොටසක්) ද දකුණට : එකී අංක 0598 පිඹුරේ ලොට් 07 ද, බටහිරට: එකී පිඹුරේ ලොට් 1 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විසිහතරක් (අක්. 0 රූ. 0 පර්. 24) වන රත්නපුර ඉඩම් කාර්යාලයේ වෙළුම/ පත්ඉරුව A 670/272 හි ලියාපදිංචි කොට ඇති බෙදා වෙන්කොට සීමා නිර්නය කල මහපාරක් වන බිම් කොටස.

අංක 1531 සහ 1934 උකස් බැඳුම්කර ප්‍රකාර උකස්කොට බැංකුවට කැප කෙරිණි.

දෙවනුව. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළයේ, උඩපත්තුවේ, කුරුවිට ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත වලන්දුරේ ග්‍රාමයේ කොළඹ-රත්නපුර මහා මාර්ගය ඔස්සේ පිහිටි "පෝෂන් ඔෆ් පැරඩයිස් එස්ටේට්" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. රාමක්‍රිෂ්ණන් විසින් සාදන ලද 1995 ජූලි 14 දාතම හා අංක 5431 දරන පිඹුරේ නිරූපිත උතුරට : කුරුවිට ටෙක්ස්ටයිල්ස් පවර්ලූම් පරිශ්‍රයද, (T.P. අංක 110945), නැගෙනහිරට : දුම්රිය රක්ෂිතයද, දකුණට : අංක 825 පිඹුරේ ලොට් 18 ද සහ බටහිරට : රත්නපුර කොළඹ මහා මාර්ගයද මායිම් වන එකී අංක 5431 පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් දාසයක් (අ. 01, රූ. 0. පර්. 16) වන බෙදා වෙන්කොට සීමා නිර්නය කල ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි සහ සෑම සියලු දේ සමගය.

ඉහත කී ඉඩම පහත විස්තර කෙරෙන ඉඩමේ ප්‍රති මිණුමකි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ, දකුණු උඩ පත්තුවේ, කුරුවිට ප්‍රාදේශීය සභා සීමාව තුළ වලන්දුරේ ග්‍රාමයේ පිහිටි උතුරට : පවර්ලූම් පරිශ්‍රයද. නැගෙනහිරට : දුම්රිය රක්ෂිතයද, දකුණට : රජයේ කර්මාන්ශාලාවට යන පාරද හා බටහිරට : රත්නපුර –කොළඹ මහා මාර්ගය ද මායිම් වන ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් දහසයක් (අ. 1, පර්. 16) වන රත්නපුර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව A 538/79 යටතේ ලියාපදිංචි කොට සීමා නිර්නය කළ "පෝෂන් ඔෆ් පැරඩයිස් එස්ටේට්" නමැති ඉඩම එහි පිහිටි ගොඩනැගිලි සහ සෑම සියලු දේ සමග

අංක 1410 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර උකස්කොට බැංකුවට කැප කෙරිණි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

03-579/5

---

## වයඹ සංවර්ධන බැංකුව – හලාවත ශාඛාව

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ආනවිලුන්දන් පත්තුවේ හලාවත ප්‍රාදේශීය සභාව තුළ හලාවත වැල්ල නමැති ගමේ පිහිටා ඇති කැබලි අංක 12 ඉඩමේ හෙක්ටයාර් 0.0154 ක් විශාල ඉඩම සහ එහි පිහිටි සියලුම දේත්, වයඹ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත 2006.04.19 දින පෙ. ව. 11.00ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ මවිසින් විකුණනු ලැබේ.

*වැඩි විස්තර සඳහා.–* 2005.09.16 දින රජයේ *ගැසට් පත්‍රය* ද 2005.11.08 දින දිණමිණ සහ තිනකරන් සහ ද අයිලන්ඩ් යන පුවත්පත් ද බලන්න.

*දේපළට ළඟාවීම.–* හලාවත නගරයේ සිට පාලම පසුකර දකුණට හැරී වාඩිය පාරේ යාර 400ක් පමණ යන විට මෙම දේපළ දකුණු පසින් පිහිටා ඇත. එනම් පල්ලියට ආසන්නයෙන් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසාන වූ වහාම ගැණුම්කරු විසින් මෙහි පහත සඳහන් මුදල් ප්‍රමාණයෙන් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 25% ක්,
2. වෙන්දේසිකරුගේ කොමිස් ගාස්තු 2.5%ක්,
3. රජයට ගෙවිය යුතු බද්ද 1%ක්,
4. වෙන්දේසියට වැයවූ අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් ඉතිරි 75%ක මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කුරුණෑගල වයඹ සංවර්ධන බැකුව ප්‍රධාන කාර්යාලය 155, මීගමු පාර, කුරුණෑගල වෙත ගෙවිය යුතුය.

වැඩි විස්තර සඳහා විමසන්න. වයඹ සංවර්ධන බැංකුව, 155, මීගමු පාර, කුරුණෑගල,

දුරකථන අංක : 037 – 2227428, 2227429.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

22, ප්‍රනාන්දු මාවත,
මීගමුව.
03 – 532

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීමයි

ණය අංකය 1/33230/සීඩී2/595.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002.06.21 *ගැසට් පත්‍රයේ* සහ 2003.01.13 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාරේ, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2006.05.06 වෙනි දින පෙරවරු 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රාදේශීය සභාවේ වැතර උප කාර්යාලයීය සීමාවන් තුළ වැතර ග්‍රාමයේ පිහිටි ගම්මැද්දේවත්ත හෙවත් කෙලෙස්ගමුව වත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. එල්. ගුණසේකර විසින් සැකසුණු 1993.08.06 දින හා අංක 4758 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0. පර්. 25.85 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

තවද, එකී අංක 4758 දරන පිඹුරේ කැබලි අංක 3 මතින් දැක්වෙන මාර්ග අයිතිය ද සමග වේ.

මෙය ඉඩම් කොටස කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 220/65, 66 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරි.*

2006 මාර්තු මස 10 වැනි දින,
කොළඹ 03,
ගාලු පාරේ, අංක 269.
03-567/4

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය 6/46286/එෆ්6/307.

1975 හි අංක 13 දරන රාජ්‍ය හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.11.03 *ගැසට් පත්‍රයේ* සහ 2006.01.03 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පන්නිපිටිය, හයිලෙවල් පාරේ, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2006.05.06 වෙනි දින පස්වරු 3.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණේ පයාගල මග්ගොන බැද්දේ, බේරුවල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සුවන්දච්චිමුල්ල ග්‍රාමයේ පිහිටි මාරගහඹිවිට, කදුරුගහඹිවිට හෙවත් උඩුමුල්ල මහඹිවිට හෙවත් පතිගොඩවත්ත පාවුල ඹිවිට හෙවත් ගල්ගොඩවත්තඹිවිට, ගල්ගොඩවත්තෙ කට්ටිය, බැදිඹිවිට හෙවත් පතිගොඩඹිවිට කට්ටි දෙක සහ මාවිලියද්ද හෙවත් ලුණුලියද්ද නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. කොඩිකාරගේ විසින් සැකසුණු 1998.03.08 දින හා අංක 2528 දරන පිඹුරේ කැබලි අංක 25 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර් 12 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

තවද, එකී අංක 2528 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක ආර් 2 සහ ආර් 3 (මාර්ගයක් සඳහා වෙන් කරන ලද) හා එකී පිඹුරේම දැක්වෙන කැබලි අංක ආර් 5 සහ ආර් 1 (ප්‍රාදේශීය සභා පාර) මතින් ඇති මාර්ග අයිතීන් ද සමග වේ.

මෙම ඉඩම් කොටස කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 221/34 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරි.*

2006 මාර්තු මස 10 වැන දින,
කොළඹ 03,
ගාලු පාරේ, අංක 269.
03-567/5

---

## සීමාසහිත සෙලාන් බැංකුව – කොග්ගල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම කෝරළේ වැලිගම නගර සභා සීමාව තුල පිහිටි වැලිගම මාතර පාර හොම්පලවත්ත නැමති වරිපනම් අංක 450/6 දරන බලයලත් මිනින්දෝරු එස්. එල්. ගලප්පත්ති විසින් සාදන ලද 1992.08.30 දිනැති අංක 4161 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන බිම් කැබැල්ලෙහි සම්පූර්ණ බිම, පළතුරු ගස්, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ බෙදා වෙන් කරන කැබලි අංක 03 ප්‍රමාණයෙන් පර්චස් දහ අටක් (අ.0, රූ.0, පර්.18) විශාල ඉඩම (මෙය මාතර දිස්ත්‍රික ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඩී 951/139 හි ලියාපදිංචි කර ඇත. පහත සඳහන් ඉඩම තුල උඩින් සහ දිගින් මාර්ග අයිතිය පාවිච්චි කිරීමේ අයිතිය සමග පෙර කී අංක 4161 දරණ සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පෙර කී මාතර පාර හොම්පලවත්ත නමැති වරිපනම් අංක 450/6 දරන ඉඩමේ බී කැබැල්ලෙහි අංක 15 දරන සම්පූර්ණ ඉඩම් කොටස පර්චස් අටක් (අ.0, රූ,0, පර්.8) විශාල ඉඩම (මෙය මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඩී 952/31 හි ලියාපදිංචි කර ඇත).

මෙම දේපල අංක 74/81, වල්ලිවල. වැලිගම සහ අංක 88, බොරාල පාර, වැලිගම හි පදිංචි පැලකැටියේ අරින්ද්‍ර සනත් කුමාර යන අය බන්ධනදායි වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපල 2006 අප්‍රේල් මස 27 වන දින පස්වරු 1.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමට පිවිසීම.–* වැලිගම බස් නැවතුම් පොලේ සිට සමරවීර පාරේ මීටර් 300 ක් ඉදිරියට ගොස් වමට ඇති අතුරු මාර්ගයේ මීටර් 400 ක් ඉදිරියට ගිය විට අදාල දේපල පිහිටා ඇත. අඩි 10 ක් පළල ඇති මාර්ගයක් මෙම දේපලට අයත්ය. වරිපනම් අංක 450/6 මාතර පාර.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2006.01.06 දින දා, ලංකාදීප සහ ඩේලිමිරර් පත්‍රයේ 2005.11.14 වන දිනද වීරකේෂරී පත්‍රයේ 2005.11.30 වන දින ද පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.–* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය..

01. ගැණුම් මිළෙන් 10%ක් ද (සියයට දහයක්),
02. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1%ක් වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්) ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2 .5%ක් ද (සියයට දෙක හමාරක් ),
04. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරිම සඳහා රු. 2000ක් ද,
05. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500.

සියළුම ප්‍රචාරක වියදම් සහ ගැනුම් මිළෙන් ඉතිරි (සියයට අනූව) 90% විකිණීමේ දින සිට දින 30 ක ඇතුළත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරි (නීති) සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ 03

දුරකථන අංක : 2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න,
උසාවි කොමසාරිස් තක්සේරුකරු
සහ බලයලත් වෙන්දේසිකරු.

ටී. ඇන්ඩ් එච් ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක : 2696155, 2572940.
03-549

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 63

**ශ්‍රී ලංකා නාවික හමුදාව-ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිළධාරියා 2006 ජනවාරි මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගන්වා ඇත :

රියර් අද්මිරාල් (ඊ) දෙවර කෝට්ටගේ අයිවන් කාරියවසම්, යූඑස්පී, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ,
ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 26 වැනි දින,
කොළඹ දී ය.
03-570/1

---

2006 අංක 64

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිළධාරියා 2006 පෙබරවාරි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායේ සිට නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

රියර් අද්මිරාල් (ඊ) දෙවර කෝට්ටගේ අයිවන් කාරියවසම්, යූඑස්පී, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ,
ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 26 වැනි දින,
කොළඹ දී ය.
03-570/2

---

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 65

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ආර්. ඒ. ජයතිස්ස මහතා, 2005 අගෝස්තු මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු වශයෙන්.

03-534

2006 අංක 66

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ ඊ.එම්. අභයරත්න මහතා 2005 ජූනි මස 23 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන්.

03-535

---

## වෙනත් පත්කිරීම් ආදිය

2006 අංක 67

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

ගුවන් හමුදාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම සඳහන් නිළධාරිණියන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි සිට ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්වරියන් වශයෙන් උසස් කෙරේ :–

ෆ්ලයින් ඔෆිසර් ජීවනී ඉඳුනිල් අබේගුණවර්ධන (ඕ ඩබ්ලිව්/01065) කාර්/ඉංජී - 11.04.2005 ;
ෆ්ලයින් ඔෆිසර් දොන් වින්ධ්‍යා ප්‍රසාදි විජේතුංග (ඕ ඩබ්ලිව්/01067) කාර්/ඉංජී - 11.04.2005 ;
ෆ්ලයින් ඔෆිසර් වර්ෂකෝන් මුදියන්සේලාගේ මොහින්ධිකා කුමාරි වර්ෂකෝන් (ඕ ඩබ්ලිව්/01066) කාර්/ඉංජී - 28.08.2005.

ජී. ඩී. පෙරේරා,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

කොළඹ.
03-521

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**ජාතික ඉතිරිකිරීමේ බැංකුව**

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ණය අංකය : 22102/135

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.10.13 දින පවත්වන ලද රැස්වීමේ දී, මෙහි පහත දැක්වෙන යෝජනාව, විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව, 1995 අංක 24 දරන පනතින් සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ :

"ජාතික ඉතිරිකිරීමේ බැංකුව නමට, ප්‍රසිද්ධ නොතාරිස් තුලාෂි මංජුලා විමලසේකර විසින් ලියා සහතික කරන ලද අංක 3308 හා 2000.07.05 දින දරන උකස්බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, උකස්කරු වන, බොරලැස්ගමුව, අඹගහපුර 5 වන පටුමග, අංක 41/5 හි ජයසූරිය ආරච්චිගේ නිහාල් කිත්සිරි පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, දැනට එකී උකස් බැඳුම්කරය මත 2005.10.06 වැනි දිනට රුපියල් එක්ලක්ෂ හැත්තෑතුන් දහස් අසූ අටකුත් ශත හැට හතරක (රු. 1,73,088.64) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක්ලක්ෂ හැත්තෑ තුන් දහස් අසූඅටකුත් ශත හැටහතරක් (රු. 1,73,088.64) ක් වූ මුදල සහ 2005.10.06 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා වර්ෂයට සියයට දහතුනකුත් දශම පහ (13.5%) බැගින් වූ පොලිය ද, සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තියට අනුකූලව අයකරගත හැකි මුදල් ප්‍රමාණයන් ද ප්‍රචාරක වියදම් හා දරන ලද වෙනත් ගාස්තු ද (ඉන්පසුව යම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒ මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා, ඉහත කී අංක 3308 දරන බැඳුම්කරය මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත උකස් කර ඇති, මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1995 අංක 24 දරන පනත මගින් සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.".

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කොරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත, කහතුඩුව සහ දියගම යන ගම්වල පිහිටි හීතවලදෙනිය *නොහොත්* ඕබඩදෙනිය සහ ඕරියගහඔව්ට නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු එල්. එල්. පී. සතරසිංහ විසින් මැන සාදන ලද අංක 60/99 හා 1999 අප්‍රේල් 10 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 46 දරන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : ලොට් ආර් 2 ද, නැගෙනහිරට : ලොට් අංක 47 ද, දකුණට : ලොට් අංක 56 සහ 57 ද, බස්නාහිරට : ලොට් අංක 45 ද යන මායිම් ඇතුළත එකී අංක 60/99 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයකුත් දශම බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 10.0) විශාලත්වය ඇති ඉඩම වේ. මෙම ඉඩම කොළඹ (දැනට හෝමාගම) ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 300/25 පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

මෙයට ඉහත කී අංක 60/99 දරන පිඹුරේ පාරක් සඳහා වෙන් කළ ලොට් ආර් 2 සහ පාරවල් සඳහා වෙන් කළ බිම් කොටස් මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය ද ඇතුළත් වේ.

කළමණාකරු (ණය),
ජාතික ඉතිරිකිරීමේ බැංකුව.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ 03.
03-551

---

**ජාතික ඉතිරිකිරීමේ බැංකුව**

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ණය අංකය : 16760/17.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.11.30 දින පවත්වන ලද රැස්වීමේ දී, මෙහි පහත දැක්වෙන යෝජනාව, විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව, 1995 අංක 24 දරන පනතින් සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ :

"ජාතික ඉතිරිකිරීමේ බැංකුව නමට, ප්‍රසිද්ධ නොතාරිස් කේ. පලිහක්කාර විසින් ලියා සහතික කරන ලද අංක 2420 හා 1997.04.29 දින දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, උකස්කරුවන් වන, (කලින් මීගොඩ, පුවක්වත්ත, අංක 108/10 දරන ලිපිනයේ සිටි) දැනට වටරැක, මතුහේන, දිමුතු උයන, අංක 102/20/2 හි සීතා යසෝමා අමරසිංහ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, දැනට එකී උකස් බැඳුම්කරය මත 2005.12.06 වැනි දිනට රුපියල් එක්ලක්ෂ අනූඑක්දහස් අටසිය අසූපහකුත් ශත දහසයක (රු. 1,91,885.16) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක්ලක්ෂ අනූඑක්දහස් අටසිය අසූපහකුත් ශත දහසයක් (රු. 1,91,885.16) වූ මුදල සහ 2005.12.06 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා වර්ෂයකට සියයට දහහත (17%) බැගින් වූ පොලිය ද, සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තියට අනුකූලව අයකරගත හැකි මුදල් ප්‍රමාණයන් ද ප්‍රචාරක වියදම් හා දරන ලද වෙනත් ගාස්තු ද (ඉන්පසුව යම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒ මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා, ඉහත කී අංක 2420 දරන බැඳුම්කරය මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත උකස් කර ඇති, මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.".

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කොරළේ, මැද පත්තුවේ, සීතාවක ප්‍රාදේශීය සභාවේ, පාදුක්ක වග උපාකර්යාල බල ප්‍රදේශය ඇතුළත් පාදුක්කේ පිහිටි කිරිවත්තුඩුවලන්ද සහ කිරිවත්තුඩුව වත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද අංක 697/1995 හා 1995.10.05 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 3 කේ ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : ලොට් 3 එල් ද, නැගෙනහිරට : ලොට් 3 ජේ ද, දකුණට : ලොට් අංක 4 ද සහ බස්නාහිරට : පාරද යන මායිම් ඇතුළත එකී අංක 697/1995 දරන පිඹුර ප්‍රකාර පර්චස් පහලොවක් (අ. 0, රූ.0, පර්.15) විශාලත්වය ඇති බිම් කට්ටිය වේ. මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 174/113 යටතේ ලියාපදංචි වී ඇත.

මෙයට එකී අංක 697/1995 දරන පිඹුරේ ලොට් 3 එල් ලෙස ලකුණු කළ පාරක් සඳහා වෙන් කළ බිම සහ එම පිඹුරේ දැක්වෙන පාර පාවිච්චි කිරීමේ අයිතිය ද ඇතුළත් වේ.

ඉහත විස්තර කරන ඉඩම, මෙහි පහත දැක්වෙන ඉඩමෙන් බෙදා වෙන් කළ අතුරු බෙදීමක් වේ :

ඉහත සඳහන් පාදුක්කේ, පාදුක්ක හොරණ පාරෙන් ඔබ්බෙහි පිහිටි කිරිවත්තුඩුව ලන්ද සහ කිරිවත්තුඩුවවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. පී. ඒ. ජයසිංහ විසින් මැන සාදන ලද අංක 2549 හා 1965.03.09 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 03 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : සහ නැගෙනහිරට : මුහන්දිරම් කැලේ ද, දකුණට : එම පිඹුරේ ලොට් අංක 4 ද, බස්නාහිරට : කබරවලදෙනිය සහ ලොට් අංක 2 ද යන මායිම් ඇතුළත, එකී අංක 2549 දරන පිඹුර ප්‍රකාර අක්කර එකයි පර්චස් තිස් හයයි පහෙන් එකක් (අ. 1, රූ.0, පර්. 36 1/5) විශාලත්වය ඇති බිම් කට්ටිය. මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන්. 131/61 යටතේ ලියාපදිංචි වී ඇත.

කළමණාකරු,
(ණය),
ජාතික ඉතිරිකිරීමේ බැංකුව.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලුපාර,
කොළඹ 03
03-550

---

**ජාතික ඉතිරි කිරීමේ බැංකුව**

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ණය අංකය : 20462/14.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.11.03 දින පවත්වන ලද රැස්වීමේ දී, මෙහි පහත දැක්වෙන යෝජනාව, විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව, 1995 අංක 24 දරන පනතින් සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ :

"ජාතික ඉතිරිකිරීමේ බැංකුව නමට, ප්‍රසිද්ධ නොතාරිස් තුලාෂි මංජුලා විමලසේකර විසින් ලියා සහතික කරන ලද අංක 2947 හා 1999.09.29 දින දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, උකස්කරුවන් වන, මල්වාන, ප්‍රදීපගම, අංක 16 දරන ස්ථානයේ, ඕබඩවත්ත කංකානමලාගේ දිල්මිණී දිනේශා කුමාරි නානායක්කාර සහ මාදොලු ආරච්චිගේ සිරිතුංග යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, දැනට එකී උකස් බැඳුම්කරය මත 2005.11.01 වැනි දිනට රුපියල් තුන්ලක්ෂ දහඅටදහස් දෙසිය හැට නවයකුත් ශත විසිතුනක (රු. 3,18,269.23) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තුන්ලක්ෂ දහඅට දහස් දෙසිය හැට නවයකුත් ශත විසි තුනක් (රු. 3,18,269.23) වූ මුදල සහ 2005.11.01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා වර්ෂයකට සියයට දහහතර (14%) බැගින් වූ පොලියද, සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 13 වන වගන්තියට අනුකූලව අයකරගත හැකි මුදල් ප්‍රමාණයන් ද ප්‍රචාරක වියදම් හා දරන ලද වෙනත් ගාස්තු ද (ඉන්පසුව යම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒ මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා, ඉහත කී අංක 2947 දරන බැඳුම්කරය මගින් ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත උකස් කර ඇති, මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1995 අංක 24 දරන පනත මගින් සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.".

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කොරළේ, ගහබොඩ පත්තුවේ, දොම්පෙ ප්‍රාදේශීය සභාවේ, (දොම්පෙ අංක 3 උපකාර්යාල බල ප්‍රදේශය ඇතුළත, දොම්පෙ පිහිටි හල්ගහවත්ත, මීගහවත්ත *නොහොත්* රදාගෙවත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද අංක 1364 හා 1998 ජනවාරි 07 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 15 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : එම පිඹුරේ ලොට් අංක 28 ද, නැගෙනහිරට : එම පිඹුරේ ලොට් අංක 16 ද, දකුණට : එම පිඹුරේ ලොට් අංක 26 ද බස්නාහිරට : එම පිඹුරේ

ලොට් අංක 14 ද යන මායිම් ඇතුළත එකී අංක 1364 දරන පිඹුර ප්‍රකාර පර්චස් පහළොවකුත් දශම එකක් (අ. 0, රූ. 0, පර්. 15.01) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි සියලු දේ වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 258/220 යටතේ ලියාපදංචි වී ඇත.

මෙයට ලොට් අංක 26 (කාණුව සමඟ මීටර් 6.6 ක් පළල පාර), ලොට් අංක 25 (කාණුව සමඟ මීටර් 6.6 ක් පළල පාර), ලොට් අංක 24 (කාණුව සමඟ මීටර් 6.6 ක් පළල පාර) සහ ලොට් අංක 27 (හැරවුම් කවය) මගින් මාර්ග අයිතිය ද ඇතුළත් ය.

කළමණාකරු,
(ණය),
ජාතික ඉතිරි කිරීමේ බැංකුව.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ 03

03-552

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 03/0/33/00409.

ණයකරුගේ සම්පූර්ණ නම : දොඹගහ පතිරගේ රේණුකා ජයන්ති පීරිස් සහ බෝම්බුවලගේ දොන් පාලිත නන්දලාල්.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. ඒ. පී. ආර්. දොමින්ගෝ විසින් ලියා සහතික කරන ලද අංක 170 හා 1996.01.04 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් තිස්එක්දහස් හාරසිය අසූහයයි ශත හැත්තෑඑකක (රු. 31,486.71) මුදලක් වර්ෂ 2002.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් විසිඑක්දහස් දෙසිය තිස්පහයි ශත හතලිස්දෙකක (රු. 21,235.42) මුදල ද වර්ෂ 2002.07.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් දහදහස් දෙසිය පනස්එකයි ශත විසිනවයක් (රු. 10,251.29) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තිස්එක්දහස් හාරසිය අසූහයයි ශත හැත්තෑඑකක් (රු. 31,486.71) ද,

(2) එකී රුපියල් විසිඑක්දහස් දෙසිය තිස්පහයි ශත හතලිස්දෙකක (රු. 21,235.42) මුදල මත අය විය යුතු වර්ෂයකට 15.% බැගින් වන පොළියක් 2002.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දකුණු කළුතර තොටමුණේ, බේරුවල් බැද්දේ, බේරුවල නගර සභා සීමාව තුළ මස්සල්වෙල පිහිටි මහකුඹුර, මහකුඹුර මහකුඹුර හෙවත් මහඹිවිට, මහකුඹුර හිරිගල් ඕවිට නමැති ඉඩම 1989.07.04 දින ඊ. ඩී. ජේ. කේ. ප්‍රේමරත්න මානකතැන විසින් මැන සම්පාදිත පිඹුරු අංක 2753 ප්‍රකාර කැබලි අංක 15ට මායිම්, උතුරට : කැබලි අංක 9 ද, නැගෙනහිරට: කැබලි අංක 14 සහ 19 ද, දකුණට : කැබලි අංක 18 සහ බටහිරට : කැබලි අංක 34 ද (අඩි 20ක් පළල පාර) යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක (අ. 0, රූ. 0, පර්. 15) වපසරියකින් යුතු වූ ඉඩම ගොඩනැගිලි, ගස්, සහිත මාර්ග පරවශතාවය ද සමඟ වේ. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 87/293හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,
වර්ෂ 2002ක් වූ සැප්තැම්බර් මස 27 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

03-559

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 03/0/00/01139.

ණයකරුගේ සම්පූර්ණ නම : කඹුරුගමුව ආචාරිගේ සුජීවා කුමාරි.

මතුගම ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එච්. එම්. ඩී. බණ්ඩාර විසින් ලියා සහතික කරන ලද අංක 171 හා 1998.08.14 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හතලිස්දහස් එකසිය විසිපහයි ශත හැටහතරක (රු. 40,125.64) මුදලක් වර්ෂ 2002.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තිස්දහස් තිස්අටයි ශත අසූහයක (රු. 30,038.86) මුදල ද වර්ෂ 2002.12.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් දහදහස් අසූහයයි ශත හැත්තෑඅටක් (රු. 10,086.78) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හතලිස්දහස් එකසිය විසිපහයි ශත හැටහතරක් (රු. 40,125.64) ද,

(2) එකී රුපියල් තිස්දහස් තිස්අටයි ශත අසූහයක (රු. 30,038.86) මුදල මත අය විය යුතු වර්ෂයකට 15% බැගින් වන පොළියක් 2003.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දකුණු කළුතර තොටමුණේ, පායියාගල බද්දේ මහා පයියාගල පිහිටි හෙම්බරවිලකැලේ නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. පී. ද සිල්වා විසින් මැන සාදන ලද අංක 749ඒ සහ 1997.08.03 දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 24 දරන බිම් කොටසට මායිම්, උතුරට : අඩි 15ක් පළල පාරකට බෙදා වෙන් කළ කැබලි අංක 14 ද, නැගෙනහිරට: කැබැලි අංක 25 ද, දකුණට : ඩී. කරෝලිස් අප්පු හිමිකම් කියන ඉඩම ද, බටහිරට : කැබලි අංක 23 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල බිම් කොටස සහ ඒ තුළ පිහිටි සියළු දේ ද මෙයට අදාළ මාර්ග පරවශතා අයිතීන් ද සමඟ කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 180/284හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.
වර්ෂ 2003ක් වූ පෙබරවාරි මස 28 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

03-560

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 19/0/00/02207.

ණයකරුගේ සම්පූර්ණ නම : බෙනඩික් ඇන්ටනි රෝජර් මිරැන්ඩා.

හලාවත ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්. එස්. අමීන් විසින් ලියා සහතික කරන ලද අංක 257 හා 2001.03.14 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ හත්දහස් එකසිය තිස්නවයයි ශත අනූදෙකක (රු. 3,07,139.92) මුදලක් වර්ෂ 2003.03.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ විසිදෙදහස් හාරසිය විසිහතයි ශත තිහක (රු. 2,22,427.30) මුදල ද වර්ෂ 2003.03.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් අසූහතරදහස් හත්සිය දොළහයි ශත හැටදෙකක් (රු. 84,712.62) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ හත්දහස් එකසිය තිස්නවයයි ශත අනූදෙකක් (රු. 3,07,139.92) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ විසිදෙදහස් හාරසිය විසිහතයි ශත තිහක (රු. 2,22,427.30) මුදල මත අය විය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2003.04.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. පී. සී. පෙරේරා යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, ආනයිවිලුන්දන් පත්තුවේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා සීමාවේ හලාවත ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ පෙරිය කරුක්කුපොන්ලායි ග්‍රාමයේ පිහිටි පල්ලියවත්ත නමැති ඉඩමට 2000.04.20 දින වී. පෙරේරා මානකතැන විසින් මැන සම්පාදිත අංක 7854 පිඹුර ප්‍රකාර ඉඩමට මායිම්, උතුරට : බී. බී. මිරැන්ඩාට අයිති ඉඩම ද, නැගෙනහිරට : මහ පාර ද, දකුණට : ඒ. ආර්.කෘෘස්ගේ ඉඩම ද සහ බටහිරට : එම්. ටී. කෘෘස් හා කේ. කෘෘස්ගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහයි දශම නවයයි හතරක් (අ. 0, රූ. 0, පර්. 11.94) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේ ද සමඟ හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 141/219හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.
වර්ෂ 2003ක් වූ මැයි මස 30 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

03-565

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 03/0/00/00874.

ණයකරුගේ සම්පූර්ණ නම : ගෝනියා මාලිමගේ අතුල ප්‍රියන්ත අපෝන්සු.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. එන්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 76 හා 1998.03.06 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හතලිස්නවදහස් එකයි ශත හැටක (රු. 49,001.60) මුදලක් වර්ෂ 2002.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තිස්දහස් පන්සිය නවයයි ශත තිස්හතක (රු. 30,509.37) මුදල ද වර්ෂ 2002.07.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් දහඅටදහස් හාරසිය අනූදෙකයි ශත විසිතුනක් (රු. 18,492.23) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හතලිස්නවදහස් එකයි ශත හැටක් (රු. 49,001.60) ද,

(2) එකී රුපියල් තිස්දහස් පන්සිය නවයයි ශත තිස්හතක (රු. 30,509.37) මුදල මත අය විය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2002.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර පයියාගල් බද්දේ වේරගල සහ මහපයියාගල පිහිටි මෙන්දොරගහවත්ත මෙන්දොරකැලේ නමැති ඉඩමෙන් කැබැලි 3සී සහ මෙන්දොරලන්ද මෙන්දොරලන්දපාවුල කට්ටිය සහ වඩුගේඋඩුමුල්ල කැලේ නමැති ඉඩම බලයලත් මිනින්දෝරු වයි. කේ. කොස්තා විසින් මැන සාදන ලද අංක 2248 සහ 1997.04.07 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබැලි අංක 5 දරන බිම් කොටසට මායිම්, උතුරට : අංක 1918 දරන පිඹුර ප්‍රකාර කැබැලි අංක 3බී ද, නැගෙනහිරට : කැබලි අංක 6 ද, දකුණට : කැබැලි අංක 30 (අඩි 15ක් පළල පාරකට වෙන් කළ) බටහිරට : කැබලි 4 ද යන මායිම් තුළ පිහිටි පර්චස් එකොලහක (අ. 0, රූ. 0, පර්. 11) විශාල බිම් කොටස සහ ඒ තුළ පිහිටි සියළු දේද මාර්ග පරවශතා අයිතිය ද සමඟ වේ. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච්. 183/286හි ලියාපදිංචි කරන ලදී.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,
වර්ෂ 2002ක් වූ සැප්තැම්බර් මස 27 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

03-564

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 19/0/00/01396.

ණයකරුගේ සම්පූර්ණ නම : රංපටි දේවගේ රංජිත් ප්‍රනාන්දු.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එච්. එච්. ජයසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 3271 හා 1998.10.05 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ තිස්දහස් අටසිය පනස් අටයි ශත තිස්එකක (රු. 1,30,858.31) මුදලක් වර්ෂ 2002.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූහත් දහස් නවසිය විසිඅටයි ශත තිස්අටක (රු. 97,928.38) මුදල ද වර්ෂ 2002.07.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස් දෙදහස් නවසිය විසිනවයයි ශත අනූතුනක් (රු. 32,929.93) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ තිස්දහස් අටසිය පනස් අටයි ශත තිස්එකක් (රු. 1,30,858.31) ද,

(2) එකී රුපියල් අනූහත් දහස් නවසිය විසිඅටයි ශත තිස්අට (රු. 97,928.38) මුදල මත අය විය යුතු වර්ෂයකට 15.71% බැගින් වන පොළියක් 2002.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්ලිව්. පී. සී. පෙරේරා යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ, දකුණු පිටිගල කෝරළේ, මැද පළාත, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාවේ මොරකැලේ පලුවැල්ගල ග්‍රාමයන්හි පිහිටි පලුවැල්ගලමූකලාන හෙවත් ගොරකගහකැලේ නමැති ඉඩමට 1998.03.30 දින එම්. ජේ. ගෝමස් මානක තැන විසින් මැන සම්පාදිත අංක 3016 පිඹුර ප්‍රකාර ලොට් බීට මායිම්, උතුරට : ගම්සභා පාර ද, නැගෙනහිරට : ලොට් ඒ ද, දකුණට : ලොට් සී ද, බටහිරට : ලොට් 6 ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිහක (අ. 0, රූ. 0. පර්. 30) වපසරියකින් යුතු ඉඩම හා ඊට අයත් සියළු දේද සමඟ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජේ 38/233හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය
වර්ෂ 2002ක් වූ සැප්තැම්බර් මස 27 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

03-563

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 19/0/00/01596.

ණයකරුගේ සම්පූර්ණ නම : වර්ණකුලසූරිය මුදියන්සේලාගේ දීපිකා දමයන්ති.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් සී. එම්. බී. බොගොල්ලාගම විසින් ලියා සහතික කරන ලද අංක 17109 හා 1998.09.14 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හතලිස්තුන්දහස් නවසිය හැටඅටයි ශත හැටතුනක (රු. 43,968.63) මුදලක් වර්ෂ 2003.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තිස්එක්දහස් එකසිය දාහතරයි ශත තිස්හයක (රු. 31,114.36) මුදල ද වර්ෂ 2003.01.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් දොලොස්දහස් අටසිය පනස්හතරයි ශත විසිහතක් (රු. 12,854.27) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හතලිස්තුන්දහස් නවසිය හැටඅටයි ශත හැටතුනක (රු. 43,968.63) ද,

(2) එකී රුපියල් තිස්එක්දහස් එකසිය දාහතරයි ශත තිස්හයක (රු. 31,114.36) මුදල මත අය විය යුතු වර්ෂයකට 15% බැගින් වන පොළියක් 2003.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. අයි. ගල්ලැල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

## උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වල්ගම්පත්තු කෝරළේ, දේවමැදිහත්පත්තුවේ, වාරියපොල ප්‍රාදේශීය සභා සීමාවේ කුරුණෑගල ලියාපදිංචි කොට්ඨාශයේ තුළ කොස්සව ග්‍රාමයේ හි පිහිටි කොස්සවවත්ත දකුණු කොටස නමැති ඉඩමට 1998.02.18 දින එස්. වෙලගෙදර මානක තැන විසින් මැන සම්පාදිත අංක 3570ඒ පිඹුර ප්‍රකාර ලොට් 39ට මායිම්, උතුරට : මෙම පිඹුරේ ලොට් 50 ද, නැගෙනහිරට : ආර්. එම්. පුංචිබණ්ඩාට හා වෙනත් අයට අයිති කුඹුර ද, දකුණට : ලොට් 38 ද, බටහිරට : ලොට් 40 හා ලොට් 42 දරන පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළවක් (අ. 0, රූ. 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරවශතාවය ද සමඟ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1123/231හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2003ක් වූ මාර්තු මස 26 වැනි දින කොළඹදී ය.

සාමාන්‍යාධිකාරී.

03-561

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 03/0/33/00210.

ණයකරුගේ සම්පූර්ණ නම : වතුතන්ත්‍රිගේ රාණි සුජාතා අල්විස්.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් වී. එල්. අසුරප්පුලි විසින් ලියා සහතික කරන ලද අංක 377 හා 1995.08.20 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් පනස්තුන්දහස් හතලිස්හයයි ශත හැත්තෑහතරක (රු. 53,046.74) මුදලක් වර්ෂ 2002.09.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තිස්නවදහස් නවසිය අනූපහයි ශත හතරක (රු. 39,995.04) මුදල ද වර්ෂ 2002.09.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් දහතුන්දහස් පනස්එකයි ශත හැත්තෑවක් (රු. 13,051.70) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පනස්තුන්දහස් හතලිස්හයයි ශත හැත්තෑහතරක් (රු. 53,046.74) ද,

(2) එකී රුපියල් තිස්නවදහස් නවසිය අනූපහයි ශත හතරක (රු. 39,995.04) මුදල මත අය විය යුතු වර්ෂයකට 15% බැගින් වන පොළියක් 2002.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

## දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දකුණු කළුතර තොටමුණේ පයාගල් බද්දේ ඉහළ වඩුගොඩහි පිහිටි කහටගහලන්ද *නොහොත්* ගමගේහේන බර්නාදුවවත්ත සහ ඇටඹගහවත්තේ කැබැලි 6 *නොහොත්* ලන්ද නමැති ඉඩමෙන් ඩබ්ලිව්. සෙනවිරත්න මානක තැන විසින් 1995.02.07 දින මැන සාදිත අංක 7755 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 36 දරන බිම් කැබැල්ලට මායිම්, උතුරට : කැබැලි අංක 35 ද, නැගෙනහිරට : කැබැලි 37 ද, දකුණට : පාර ද, බටහිරට : අංක 289 පිඹුරේ අංක 5 යන මායිම් තුළ පිහිටි පර්චස් දහනවයක (අ. 0, රූ. 0, පර්. 19) වපසරියකින් යුතු වූ ඉඩම මීට අයත් මාර්ග පරවශතාවය ද සමඟ වේ. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච්. 144/267හි ලියාපදිංචි කරන ලදී.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

වර්ෂ 2002ක් වූ නොවැම්බර් මස 29 වැනි දින කොළඹදී ය.

සාමාන්‍යාධිකාරී.

03-562

---

## සීමාසහිත සෙලාන් බැංකුව-කොටියකුඹුර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003 අගෝස්තු මස 15 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය අංකය : 4701460/4710870.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඊ. ඩී. එම්. ජයවර්ධන විසින් සහතික කරන ලද 1994.07.18 දිනැති අංක 7394, 1995.06.15 දිනැති අංක 7663, 1995.12.01 දිනැති අංක 7838, 1996.09.02 දිනැති අංක 8087 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කොටියකුඹුර පදිංචි ශාන්ත හේවා පතිරණ සහ හබරාදුව කංකානමලාගේ පද්මසීලි යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් නවලක්ෂ පනස්අටදහස් විසිඑකයි ශත විස්සක් (රු. 9,58,021.20) මුදලක්, 2002 මැයි මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 9,58,021.20 මුදල ද, 2002 ජුනි 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිහ (30%) බැගින් වූ පොළිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 7394, 7663, 7838 සහ 8087 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර කේ. පී. එන්. සිල්වා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

## උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, කඳුපිට පත්තුවේ, අම්පේ උතුර පිහිටි බලයලත් මිනින්දෝරු සී. කේ. බැද්දවෙල විසින් සාදන ලද 1992.12.26 දිනැති අංක 5647 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කුඩාදුරයලාගේ පරණවත්ත නමැති, ඉඩමේ කැබලි අංක 4 සහ 5 දරන බෙදා වෙන් කරන ලද යාබද සම්පූර්ණ ඉඩම් කොටසට මායිම්, උතුරට : ඇල ද, නැගෙනහිරට : එකී සැලැස්මේ අංක 3 කැබැල්ල ද, දකුණට : එකී සැලැස්මේ කැබැලි අංක 13 සේ ලකුණු කළ අඩි 15ක් පළල ප්‍රවේශය ද, බටහිරට : එකී සැලැස්මේ කැබැලි අංක 6 ද යන මායිම් තුළ පර්චස් විසි හයයි දශම පහයි බිංදුවක් යන මායිම් තුළ (අ. 0, රූ. 0, පර්. 26.50) විශාල එහි පිහිටි සියලු දේ සමඟ ඉඩම සහ එකී සැලැස්මේ කැබලි අංක 13 ලකුණු කළ මාර්ග අයිතිය පාවිච්චි කිරීමේ අයිතිය සමඟ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

03-597

---

## සීමාසහිත සෙලාන් බැංකුව-යක්කල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005 ඔක්තෝබර් මස 10 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය අංකය : 3102372.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එස්. සී. පොන්දේනා විසින් සහතික කරන ලද 1993 දෙසැම්බර් මස 27 දිනැති අංක 862, 1994 නොවැම්බර් මස 21 දිනැති අංක 1213 සහ 1995 සැප්තැම්බර් මස 04 දිනැති අංක 1707 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, උඩතුත්තිරිය පදිංචි ගුස්තින්න ලියන ප්‍රැට්‍රික් රොහාන් ද සිල්වා යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පහලොස් ලක්ෂ හැත්තෑනව දහස් නවසිය හැත්තෑවයි ශත අසූඑකක (රු. 15,79,970.81) මුදලක්, 1999 පෙබරවාරි මස 28 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 15,79,970.81 මුදල ද, 1999 මාර්තු මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිහ (30%) බැගින් වූ පොළිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 852, 1213 සහ 1707 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

## උපලේඛනය

1\. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, මහර ප්‍රාදේශීය සභාවේ හිරිපිටිය උප කාර්යාල සීමාව තුළ වරපලාන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. එම්. ඩොනල්ඩ් විසින් සාදන ලද 2001.03.30 දිනැති අංක 1840ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන නුගේලන්ද සහ හිරිමුල්ලේ කැලේ *හෙවත්* ගිරිමුල්ලේ කැලේ නමැති ඉඩමේ කැබලි අංක 6 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, වයඹට : දැන් සනත් ප්‍රියංකරට අයිති බලයලත් මිනින්දෝරු එච්. එම්. ඩොනල්ඩ් විසින් සාදන ලද 1991 පෙබරවාරි මස 28 දිනැති අංක 649 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 1 ද, ඊසානට : එකී අංක 1840ඒ දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 1 ද, ගිණිකොනට : එකී අංක 1840ඒ දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 7 ද, නිරිතට : දැන් පී. ඒ. ගුණසේකරට අයිති මෙම ඉඩමේ කොටස ද යන මායිම් තුළ පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) (හෙක්ටයාර 0.03794) විශාල ඉඩම.

පෙර කී කැබලි අංක 6 පෙර කී වරපලාන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. එම්. ඩොනල්ඩ් විසින් සාදන ලද 1991.02.28 දිනැති අංක 649 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන නුගේලන්ද සහ හිරිමුල්ලේ කැලේ *හෙවත්* ගිරිමුල්ලේ කැලේ නමැති ඉඩමේ කැබලි අංක 2ඊ ලකුණු කල කැබැල්ලේ කොටසක් වන අතර එයට මායිම්, වයඹට : අංක 649 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 1 ද, ඊසානට : කැබැලි අංක 2ඒ ද, ගිණිකොනට : කැබැලි අංක 2එච් ද, නිරිතට : පී. ඒ. ගුණසේකර විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පර්චස් විසි දෙකයි දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 22.10) විශාල ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරුව ඊ 410/51 යටතේ ලියාපදිංචි කර ඇත.

2\. පෙර කී වරපලාන ගමේ පිහිටි පෙර කී අංක 649 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන නුගේලන්ද සහ හිරිමුල්ලේ කැලේ *හෙවත්* ගිරිමුල්ලේ කැලේ නමැති ඉඩමේ කැබලි අංක 2සී ලකුණු කළ බෙදා වෙන් කල ඉඩමේ කොටසට මායිම්, වයඹට : පුද්ගලික පාර ද, ඊසානට : දැන් අමරසේකර සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, ගිණිකොණට : කැබැලි අංක 2ඩී සහ නිරිතට : කැබැලි අංක 2බී ද යන මායිම් තුළ පර්චස් පහළොවයි දශම හතරයි පහක් (අ. 0, රූ. 0, පර්. 15.45) විශාල ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරුව ඊ 410/49 යටතේ ලියාපදිංචි කර ඇත.

3\. පෙර කී වරපලාන ගමේ පිහිටි පෙර කී අංක 649 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන නුගේලන්ද සහ හිරිමුල්ලේ කැලේ *හෙවත්* ගිරිමුල්ලේ කැලේ නමැති ඉඩමේ කැබැලි අංක 2ඩී ලකුණු කල බෙදා වෙන් කළ ඉඩමේ කොටසට මායිම්, වයඹට : කැබැලි අංක 2බී සහ 2සී ද, ඊසාණට : දැන් අමරසේකර සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, ගිණිකොනට : කැබැලි අංක 2එප් සහ නිරිතට : කැබැලි අංක 2ඒ ද යන මායිම් තුළ පර්චස් විසිතුනයි දශම නවයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 23.90) විශාල ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරුව ඊ 410/50 යටතේ ලියාපදිංචි කර ඇත.

4\. පෙර කී වරපලාන ගමේ පිහිටි පෙර කී අංක 649 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන නුගේලන්ද සහ හිරිමුල්ලේ කැලේ *හෙවත්* ගිරිමුල්ලේ කැලේ නමැති ඉඩමේ කැබැලි අංක 2එෆ් ලකුණු කල බෙදා වෙන් කළ ඉඩමේ කොටසට මායිම්, වයඹට : කැබැලි අංක 2ඩී ද, ඊසාණට : දැන් අමරසේකර සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, ගිණිකොනට : කැබැලි අංක 2පී සහ නිරිතට : කැබැලි අංක 2ඒ ද යන මායිම් තුළ පර්චස් විසිදෙකයි දශම හතයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 22.70) විශාල ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරුව ඊ 410/52 යටතේ ලියාපදිංචි කර ඇත.

5\. පෙර කී වරපලාන ගමේ පිහිටි පෙර කී අංක 649 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන නුගේලන්ද සහ හිරිමුල්ලේ කැලේ *හෙවත්* ගිරිමුල්ලේ කැලේ නමැති ඉඩමේ කැබැලි අංක 2පී ලකුණු කල බෙදා වෙන් කළ ඉඩමේ කොටසට මායිම්, වයඹට : කැබැලි අංක 2එෆ් ද, ඊසාණට : දැන් අමරසේකර සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, ගිණිකොනට : කැබැලි අංක 2අයි සහ නිරිතට : කැබැලි අංක 2ඒ ද යන මායිම් තුළ පර්චස් විසිහතරයි දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 24.10) විශාල ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරුව ඊ 410/53 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙහි පහත සවිස්තරව විස්තර කරනු ලබන මාර්ගය සඳහා වෙන් කිරීම තුළ, උඩින් සහ දිගේ වාහන ගමනාගමනය සහ පාගමනින් යන දෙආකාරයටම පරිහරණය කිරීමේ පූර්ණ සහ නිදහස් අයිතිය සමඟ.

පෙර කී වරපලාන ගමේ පිහිටි පෙර කී අංක 649 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන නුගේලන්ද සහ හිරිමුල්ලේ කැලේ *හෙවත්* ගිරිමුල්ලේ කැලේ නමැති ඉඩමේ කැබැලි අංක 2ඒ ලකුණු කල බෙදා වෙන් කළ ඉඩමේ කොටසට මායිම්, වයඹට : පුද්ගලික පාර ද, ඊසාණට : කැබලි අංක 2බී, 2ඩී, 2එෆ් සහ 2පී ද, ගිණිකොනට : කැබැලි අංක 2අයි සහ නිරිතට : කැබැලි අංක 2එච්, 2ඊ සහ කැබලි අංක 1 ද යන මායිම් තුළ පර්චස් දහඅටයි දශම නවයයි පහක් (අ. 0, රූ. 0, පර්. 18.95) විශාල ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරුව ඊ 350/281 සහ ඊ 410/55හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

03-595/1

---

## සීමාසහිත සෙලාන් බැංකුව-කුරුණෑගල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005 දෙසැම්බර් මස 28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0180-00014780-001.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ගුණවර්ධන විසින් සහතික කරන ලද 1997 දෙසැම්බර් මස 17 දිනැති අංක 1419 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කුරුණෑගල පදිංචි හිටිහාමිලාගේ කපිලසිරි හේරත් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දහහත් ලක්ෂ අසූඑක්දහස් තුන්සිය හතලිස් අටයි ශත දහනවයක් (රු. 17,81,348.19) මුදලක්, 2002 අගෝස්තු මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 17,81,348.19 මුදල ද, 2002 සැප්තැම්බර් 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොළිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1419 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර ටී. සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

## උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, තිරගන්දාහේ කෝරළේ, වැඋඩ විල්ලිහත්පත්තුවේ විල්ගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු පී. බී. දිසානායක විසින් සාදන ලද 1990.01.03 දිනැති අංක 654 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන විල්ගොඩ එස්ටේට් නමැති ඉඩමේ කැබැලි අංක 2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : තිස්සංකපුර සිට විල්ගොඩ හන්දිය දක්වා පාර ද, නැගෙනහිරට : අංක 1092 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 44 ද, දකුණට : එකී අංක 654 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 3 සහ බටහිරට : එකී අංක 654 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 1 ද යන මායිම් තුළ පර්චස් විසි දෙකක් (අ. 0, රූ. 0, පර්. 22) විශාල, ගස්, වගා සහ එහි පිහිටි ගොඩනැගිලි සමග ඉඩම. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ඒ 1186/198 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

03-595/2

---

## සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය

ඊ. එම්. ඩී. ටී. ඒකනායක සහ ජේ. පී. ඩබ්ලිව්. ජයසිංහ

ගිණුම් අංකය : 0023 5001 9203.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003 නොවැම්බර් 27 වන දින පවත්වන ලද රැස්වීමේදී, විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන්, පහත දැක්වෙන යෝජනාව සම්මත කර ගන්නා ලදී :--

සීමාසහිත සම්පත් බැංකුව නමට කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් එච්. එස්. පී. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 5088 හා 2000 නොවැම්බර් 16 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හල්මිල්ලාවැව, හල්මිල්ලාවැව පදිංචි ඒකනායක මුදියන්සෙලාගේ දිමුත් තුෂාර ඒකනායක සහ ජයසිංහ පතිරැන්නැහැලාගේ විමලා ජයසිංහ විසින් එකී බැඳුම්කරයේ බන්ධනදායීන් වශයෙන් සිටිමින් සහ එකී ජයසිංහ පතිරැන්නහැලාගේ විමලා ජයසිංහ යන අය උකස්කරු වශයෙන්ද සිටිමින් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය මත 2003 ජූලි 31 වන දිනට රුපියල් හයලක්ෂ අනූතුන්දහස් හත්සිය අසූවයි ශත දාහතර (රු. 6,93,780.14) ක මුදලක් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් සීමාසහිත සම්පත් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හයලක්ෂ අනූතුන්දහස් හත්සිය අසූවයි ශත දාහතර (රු. 693,780.14) ක මුදල සහ 2003 අගෝස්තු 01, දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් හාරලක්ෂ අසූහත්දහස් පන්සීය (රු. 487,500) ක් සඳහා වර්ෂයකට සියයට විසිදෙක (22%) බැගින් වූ වැඩිදුර පොලිය සහ ප්‍රචාරක දැන්වීම් ගාස්තු සහ වෙනත් ගාස්තුද යන මුදල් ප්‍රමාණ, ඉන් පසුව යම් මුදලක් ගෙවා ඇත්නම් ඒ මුදල අඩු කොට අය කර ගැනීම සඳහා, ඉහත කී අංක 5088 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුව වෙත උකස් කර ඇත්තා වූ ද, මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද, දේපළ සහ පරිශ්‍රය, කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩන්ස්ටන් සහ ඩැලස් කෙලාර්ට් මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින්

පැවරී ඇති බලතල ප්‍රකාර සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පිළිවෙලින් දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරලේ කටුපොත ගමෙහි සහ කටුගම්පොල හත්පත්තුවේ මැද්දෙකැටිය කෝරලේ උමංගාව සහ කුරක්කන්හේනේගෙදර ගම්වල පිහිටි ගුරුගල්ගොඩවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක විසින් මැන සාදන ලද අංක 1313 සහ 2000 අගෝස්තු 31 දින දරන පිඹුරේ දැක්වෙන අංක 1 ලෙස ලකුණු කරන ලද බෙදා වෙන් කල බිම් කට්ටිය වන උතුරු-නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් මැන සාදන ලද අංක 5242ඒ දරන පිඹුරේ අංක 2 දරන කට්ටිය, ඉහත කී අංක 1313 දරන පිඹුරේ අංක 2 සහ 3 දරන කට්ටි ද, දකුණු-නැගෙනහිරට : ඉහත කී අංක 5242ඒ දරන පිඹුරේ අංක 4 දරන කට්ටිය ද, දකුණු-බස්නාහිරට : මූණමල්දෙනියේ සිට කටුපොතට යන ප්‍රධාන පාර සහ උතුරු-බස්නාහිරට : ඉහත කී අංක 5242ඒ දරන පිඹුරේ අංක 2 දරන කට්ටිය, බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් මැන සාදන ලද අංක 4774 දරන පිඹුරේ දැක්වෙන ඉඩම සහ සුසාන භූමිය ද යන මායිම් තුළ අක්කර දෙක (අ. 2, රූ. 0, පර්. 0) ක් හෝ හෙක්ටෙයාර් බින්දුවයි දශම අටයි බින්දුවයි නවයයි හතර (හෙක්ටෙයාර් 0.8094) ක් විශාල ඉඩමේ බිම ගහකොල වැවිලි ගොඩනැගිලි සහ එහි පිහිටි සහ එයට ආබද්ධ සෑම සියළු දෙයද වේ.

එකී ඉඩම මෙහි පහත විස්තර කරන විශාල ඉඩමෙන් නිශ්චිතව බෙදා වෙන් කරන ලද කොටසක් වේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පිළිවෙලින් දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරලේ කටුපොත ගමෙහි සහ කටුගම්පොල හත්පත්තුවේ මැද්දෙකැටිය කෝරලේ උමංගාව සහ කුරක්කන්හේනගෙදර ගම්වල පිහිටි ගුරුගල්ගොඩවත්ත නැමැති ඉඩමේ ඉහත කී අංක 1313 සහ 2000 අගෝස්තු 31 දින දරන පිඹුරේ දැක්වෙන අංක 1 සහ 2 ලෙස ලකුණු කරන ලද බෙදා වෙන් කල එකිනෙකට යාව සහ යාබදව පිහිටි බිම් කට්ටි එක්වීමෙන් සෑදුන දේපල වන එකී අංක1313 දරන පිඹුර ප්‍රකාරව උතුරු-නැගෙනහිරට : පාර ද, දකුණු නැගෙනහිරට : ඉහත කී අංක 1313 දරන පිඹුරේ අංක 3 දරන කට්ටිය සහ බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් මැන සාදන ලද අංක 5242 ඒ දරන පිඹුරේ දැක්වෙන අංක 4 දරන කට්ටිය ද, දකුණු -බස්නාහිරට : බස් පාර සහ උතුරු බස්නාහිරට : ඉහත කී අංක 5242ඒ දරන පිඹුරේ අංක 1 සහ 2 දරන කට්ටි සහ බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් මැන සාදන ලද අංක 4774 දරන පිඹුරේ දැක්වෙන ඉඩම සහ සුසාන භූමිය ද යන මායිම් තුළ අක්කර තුන (අ. 3, රූ. 0, පර්. 0) ක් හෝ හෙක්ටයාර් එකයි දශම දෙකයි එකයි හතරයි එක (හෙ. 1.2141) ක් විශාල ඉඩමේ වේ. එකී ඉඩම කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1009/255 වෙළුමේ/පත්‍රිරුවේ සහ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන්. 53/392 වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-579/3

---

### සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණයඅයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0035 1000 2929.

2005 සැප්තැම්බර් 01 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගාල්ල, මාඉටිපේ, දෙවන පටුමග, අංක 12 හි පදිංචි, එකී ජනරජයේ අහංගම, මාතර පාරේ අංක 71/1හි සහ ගාල්ල, මාඉටිපේ, දෙවන පටුමග, අංක 12 යන ස්ථානයන්හි කෙන්ට් ගාමන්ට් යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ පවත්වාගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකාරිය වන පොල්වත්ත සමරවීර ආරච්චිලාගේ දිනූෂා දමයන්ති යන අය බන්ධනදායී වශයෙන්, ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. එම්. මෙන්දිස් විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2004 ජූලි 23 දාතම හා අංක 1589 දරන උකස් බැඳුම්කරය, මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන්, 2005 පෙබරවාරි 28 වන දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහනව ලක්ෂ දෙදහස් පන්සිය විසි අටයි ශත තිස් හතරක (රු. 19,02,528.34) ක මුදලක් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දහනව ලක්ෂ දෙදහස් පන්සිය විසිඅටයි ශත තිස් හතරක සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් දාහත් ලක්ෂ අසූ අට දහස් තුන්සියයක (රු. 17,88,300) මුදල සඳහා වසකරට සියයට නවයයි දශම පහ (9.5%) බැගින් 2005 මාර්තු 01 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 1589 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද, මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර හා මහනගර සභා සීමාව ඇතුළත මාඉටිපේ ග්‍රාමයේ පිහිටි කපුලන්දකුඹුර නැමැති ඉඩමේ ලොට් අංක 13 හි ලොට් අංක 13B වශයෙන් ලකුණු කොට ඇති බිම් කොටසේ ලොට් අංක 13 B 1 වශයෙන් ලකුණු කොට ඇති බලයලත් මිනින්දෝරු ඒ. ඩී. ඒ. ගුණසේකර විසින් සාදන ලද 2004 ජූනි 21 දාතම හා අංක 3251 පිඹුරට අනුව උතුරට : ඇත්තිලිගොඩ ශ්‍රී සුගතපාල මාවතද, නැගෙනහිරට : මාඉටිපේ අංක 2 පටුමගද, දකුණට : එම ඉඩමේම ලොට් 13 B2 සහ ලොට් 13 B3 වශයෙන් ලකුණු කල බිම් කොටස්ද සහ බටහිරට : එම ඉඩමේම ලොට් 13A වශයෙන් ලකුණු කළ කොටසද මායිම වන ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිපහයි දශම දෙකක් (අක්. 0, රූඩ් 1, පර්. 25.2) වන ගාල්ල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A603/83 යටතේ ලියාපදිංචි කර ඇති බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටසය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

03-579/2

---

### සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0026 1000 5287.

2005 සැප්තැම්බර් 01 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පානදුර, ගොරකපොල, කුරුප්පු මාවත, අංක 331/5 හි පදිංචි, පානදුර, ගොරකපොල, ගාලු පාරේ අංක 248 හි ඉන්දික මෝටර්ස් යන ව්‍යාවහාරික ව්‍යාපාර නාමය යටතේ හවුලේ ව්‍යාපාරික කටයුතු කරන ගමගේ දොන් හේමන්ත නන්දික, ගමගේ දොන් ජයන්ත ඉන්දික සහ ජයවර්ධන වික්‍රමරත්න මහා විදානෙලාගේ ඇන් හේමපාල යන අය බන්ධනදායීන් වශයෙන් ද ඉහත කී පානදුර ගොරකපොල, කුරුප්පු මාවතේ අංක 331/5 හි ජයවර්ධන වික්‍රමරත්න මහාවිදානෙලාගේ ඇන් හේමපාල යන අය උකස්කරු වශයෙන්ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2003 අප්‍රේල් 15 දාතම හා අංක 855 දරන උකස් බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2005 අප්‍රේල් 19 වන දිනට රුපියල් දහසය ලක්ෂ හැටහය දහස් හාරසීය පනස් හතයි ශත දොළහක (රු.16,66,457.12) මුදලක් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දාසයලක්ෂ හැටහය දහස් හාරසීය පනස්හතයි ශත දොළහක (රු.16,66,457.12) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් දහතුන් ලක්ෂ පනස්දහස් පන්සීයයක (රු.13,50,500) මුදල සඳහා වසරකට සියයට පහළොව (15%) බැගින් ද, තවත් රුපියල් දෙලක්ෂ තිස්තුන් දහස් පන්සීයයක මුදල සඳහා වසරකට සියයට දාසය (16%) බැගින්ද 2005 අප්‍රේල් 20 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේනම්) අඩුකාට අයකර ගැනීම සඳහා එකී අංක 855 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද, මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත ගොරකපොල පිහිටි 1 වන පටුමග, ගාලුපාරේ, වරිපනම් අංක 36/2 හි රතුවත්ත, කුරුඳුවත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. අබේසුන්දර විසින් සාදන ලද 2002 මාර්තු 15 දාතම හා අංක 241/A දරන පිඹුරේ නිරූපිත, ලොට් 1A වශයෙන් ලකුණු කොට දක්වා ඇති, උතුරට : අංක 2582 පිඹුරේ ලොට් IQ(අඩි 20 පළල පාරට වෙන්කල කොටස) ද, නැගෙනහිරට : ඩබ්ලිව්. පී. ප්‍රනාන්දු, ඩී. බී. පීරිස් සහ ඉයුජීන් ද සිල්වා යන අයගේ කහටගහවත්ත ද, දකුණට : එම ඉඩමේම එල්. ජේ. සිල්වාගේ ලොට් 2 ද සහ බස්නාහිරට : අංක 2582 පිඹුරේ ලොට් 1 B ද මායිම් වන එකී අංක 241 A පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හතරක් (අක්. 0, රූ. 0, පර්. 20.4) වන බෙදා වෙන්කොට සීමා නිර්නය කළ ඉඩම එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේ සමගය.

ඉහත කී අංක 241 පිඹුරේ ලොට් 1A පහත විස්තර කෙරෙන ඉඩමේ ප්‍රතිමිණුමකි.

බස්නාහිර පළාතේ පානදුර තොටමුනේ පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභා සීමාව ඇතුලත ගොරකපොල පිහිටි පළමු පටුමග, ගාලු පාරේ වරිපනම් අංක 36/2 හි රතුවත්තේ කුරුඳුවත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. එල්. ද සිල්වා විසින් සාදන ලද 1981 නොවැම්බර් 18 දාතම හා අංක 2582 දරන පිඹුරේ ලොට් 1A වශයෙන් ලකුණු කොට නිරූපිත පානදුර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව F415/236 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 2582 පිඹුරට අනුව උතුරට : ලොට් IQ(පාර) ද, නැගෙනහිරට : ඩබ්ලිව්. පී. ප්‍රනාන්දු, ඩී. බී. පීරිස් සහ එව්ජින් ද සිල්වාගේ කහටගහවත්ත ද, දකුණට : එම ඉඩමේම එල්. ජේ. සිල්වාගේ ලොට් 2 ද, සහ බටහිරට : ලොට් 1 B ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හතරයි දෙකක් (අක්. 0, රූඩ්. 0, පර්. 20.42) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ ඉඩම් කොටස එහි පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේ සමගය.

මතු දැක්වෙන ඉඩම මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමගය.

ඉහත කී ගොරකපොල පිහිටි රතුවත්තේ කුරුඳු වත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. එල්. ද සිල්වා විසින් සාදන ලද 1981 නොවැම්බර් 18 දාතම හා අංක 2582 පිඹුරේ නිරූපිත ලොට් IQ වශයෙන් ලකුණු කොට දක්වා ඇති, පානදුර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව F353/250 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 2582 පිඹුරට අනුව උතුරට : කුරුප්පු මාවත, ලොට් අංක If, IG, IH, IJ, IK, IL, IM සහ IN ද, නැගෙනහිරට : කහටගහවත්ත ද, දකුණට : අංක 2582 පිඹුරේ ලොට් අංක IE, ID, IC, IB, IA ද සහ බටහිරට : ජී. ඩී. සොලමන් සහ රත්න භාරතී ගේ දෙල්ගහවත්ත ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විසිඅටයි දශම පහක් (අක්. 0, රූ. 0, පර්. 28.5) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ බිම් කොටස ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

03-579/1

---

### සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0018 5000 3528.

2004 දෙසැම්බර් මස 16 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුනු රැස්වීමේදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රත්මලාන, ධර්මරාම පාර, අංක 26බීහි පදිංචි රන්තුලු නන්දිමිත්‍ර ජී. ද සොයිසා යන අය බන්ධනදායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර සහ ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ පිළිවෙලින් 1999 පෙබරවාරි මස 24 දාතම හා අංක 738 දරන සහ 2000 පෙබරවාරි මස 12 දාතම හා අංක 463 දරන උකස් බැඳුම්කර මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2003 ජූනි මස 19 වන දිනට එකී බැඳුම්කර මත අයවීමට ඇති සම්පූර්ණ හිඟ මුදල වශයෙන් සීමාසහිත සම්පත් බැංකුවට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දාහත් ලක්ෂ දාහතරදහස් නවසිය පනහයි ශත විසිහයක (රු. 17,14,950.26) මුදල් ප්‍රමාණයක් අයවිය යුතුව හා හිඟව ඇති හෙයින් එකී රුපියල් දාහත් ලක්ෂ දාහතර දහස් නවසිය පනහයි ශත විසිහයක (රු. 17,14,950.26) සම්පූර්ණ මුදල සමඟ තවත් රුපියල් නව ලක්ෂයක (රු. 9,00,000) මුදල සඳහා වසරකට සියයට විසිතුන (23%) බැගින් සහ තවත් රුපියල් තුන්ලක්ෂ පනස් දහසක (රු. 3,50,000) මුදල සඳහා වසරකට සියයට විසිහතර (24%) බැගින් ද 2003 ජූනි මස 20 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල් ද සමඟ ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමඟ එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 738 සහ 463 දරන බැඳුම්කර මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ෂොක්මන් සහ සමරවික්‍රම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, හික්කඩුව ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත මාදම්පේ විල්ලිගොඩ පිහිටි ගල්වඩුවත්ත හි සීමා නිර්ණය කළ ලොට් 14හි කොටසක් නමින් හැඳින්වෙන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. ජී. මෙන්ඩිස් විසින් සාදන ලද 1998 දෙසැම්බර් මස 12 දාතම හා අංක 4878 දරන පිඹුරේ නිරූපිත ලොට් 14ඒ ලෙස ලකුණු කොට දක්වා ඇති, උතුරට : එම ඉඩමේම ලොට් 12 ද, නැගෙනහිරට : මාදම්පේ සිට අළුත්වල දක්වා දිවෙන මාර්ගය ද, දකුණට : එම ඉඩමේම ලොට් 15 සහ බෝයගේ වත්ත ද, සහ බටහිරට : බෝයගේ වත්ත සහ අඩි පාර ද මායිම් වන, ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහතුනයි දශම හතයි පහක් (අ. 0, රූ. 1, පර්. 13.75) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කල බිම් කොටස එහි ඇති ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේ සමගය.

එකී ලොට් 14ඒ බිම් කොටස පහත විස්තර කරන පරිදි ලොට් 14 ඉඩමේ ප්‍රති මිනුමකි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, මාදම්පේ විල්ලිගොඩ පිහිටි ගල්වඩුවත්තේ ලොට් 14 නමැති, බලයලත් මිනින්දෝරු ජෝන් ඒ. ද සිල්වා විසින් අඳින ලද 1937 මැයි 15 සහ 18 දාතම සහ බෙදුම් අංක 194ඒ දරන සහ ගාල්ල දිස්ත්‍රික් උසාවියේ නඩු අංක 21439 වශයෙන් වාර්තා කොට ගොනු කොට ඇති පිඹුරට අනුව උතුරට : එම ඉඩමේම ලොට් 12 හා 13 ද, නැගෙනහිරට : ගම්සභා පාර සහ මහගෙදරවත්ත, කෝපි වත්ත ද, දකුණට : එම ඉඩමේම ලොට් 15 සහ බටහිරට : බෝයගේ වත්ත සහ එම ඉඩමේම ලොට් 9 ද මායිම් වන, ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් දාහතරයි දශම අටයි තුනක් (අ. 0, රූ. 1, පර්. 14.83) වන ගාල්ල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව සී 719/145හි ලියාපදිංචි කොට වෙළුම/පත්‍රිරුව සී 719/238 වෙත ගෙන යන ලද බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ ඉඩම එහි ඇති පස සහ ගහ කොළ අනෙකුත් සියළුම දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්,

03-579/4

මුද්‍රණය හා බෙදාහැරීම සීමාසහිත ශ්‍රී ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk

## ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

එන් 19.

මගේ අංකය : එල්ඩී/05/2005/වීර්වී/118.

2005 ජූලි මස 04 වැනි දින අංක 1400/07 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 68 දරන (460 වන අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාවෙන් මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39(අ) වන වගන්තියෙහි 1 වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා දේශීය වෛද්‍ය අමාත්‍ය තිස්ස කරල්ලියද්ද වන මම, එකී ඉඩම් කොටස් මෙම නියමය මගින් අවසතු කරමි.

තිස්ස කරල්ලියද්ද,
ඉඩම් හා දේශීය වෛද්‍ය අමාත්‍ය.

ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය : 4/1/1-2/734ඒ/2.
ඉඩම් හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"ගොවිජන මන්දිරය".
බත්තරමුල්ල,
2005 නොවැම්බර් මස 14 වැනි දින.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කළුතර තොටමුණ දකුණ සුළු කොට්ඨාශයේ කුඩා පයාගල දකුණ ගමේ පිහිටි, මැණුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද කේඒ/බීආර්ඩබ්/05/179 සහ 2005 මැයි මස 30 වැනි දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක් 0.141 ක් පමණ වන ගොරකගහවත්ත නමැති ඉඩම් කොටසට මායිම් :

උතුරට: විදුලි පෞද්ගලික සමාගමට අයත් ඉඩම සහ දුම්මලමෝදර ඇල; නැගෙනහිරට :දුම්මලමෝදර ඇල සහ දෝන මේරි තේජානි විසින් හිමිකම් කියන නම සොයාගත නොහැකි ඉඩම ; දකුණට : දෝන මේරි තේජානි විසින් හිමිකම් කියන නම සොයාගත නොහැකි ඉඩම සහ මහා මාර්ගය ; බටහිරට : මහා මාර්ගය සහ විදුලි පෞද්ගලික සමාගමට අයත් ඉඩම.

12-97

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදය) 72 වන වගන්තිය යටතේ දැන්වීම

එන් 20.

යොමු අංකය : 4/1/1-1/735ඒ/6.

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම රජයට අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා අංක 1426/4 දරන 2006.01.02 දිනැති ශ්‍රී *ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය* බලන්න.

බර්නාඩ් වසන්ත,
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

### උපලේඛනය

| | | |
|---|---|---|
| *දිස්ත්‍රික්කය* | : | කළුතර |
| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | : | බේරුවල |
| *ග්‍රාම නිලධාරි කොට්ඨාසය* | : | 735ඒ - උතුරු පයාගල |
| *ගමේ නම* | : | උතුරු පයාගල |
| *ඉඩමේ නම* | : | ලියන්නාවත්ත, සෙන්දප්පෙරුමවත්ත සහ බෝගහවත්ත |
| *සැලසුම් අංකය* | : | මු. පි. ක. 3793 |
| *කැබලි අංකය* | : | 01 |

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ දැන්වීම

එන් 21

මගේ අංකය :978/03/05/01/22.
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
කොලොන්න.
2005.12.30

පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කරන ඉඩම රජයට අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා අංක 1426/19 දරන 2005.01.05 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්පත්‍රයේ* III කොටස බලන්න.

එම්. ඒ. ටී. සෙනරත්,
ප්‍රාදේශීය ලේකම්,
කොලොන්න.

2005 දෙසැම්බර් 30 වැනි දින
කොලොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | : | කොලොන්න |
| *ගම* | : | කැල්ල |
| ඉඩමේ පිහිටීම | : | සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොලොන්න කෝරලේ, කොලොන්න ගම් පත්තුවේ කැල්ල ග්‍රාම නිලධාරි වසමේ, මැදගොඩේවත්ත නැමැති ඉඩම |
| *ඉඩමේ නම* | : | මැදගොඩේ වත්ත |
| *පිඹුරු අංකය හා කැබලි අංකය* | : | අ. ග. පි. 905 හි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක ආර්/කේ./එල්. එන්./2005/105 දරන පිඹුරේ කැබලි අංක 1005 |

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

එන් 22.

මගේ අංකය : සො/ඉ/1/5/84

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම් රජයට ලබා ගැනීමට බලාපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා වර්ෂ 2006 ක් වූ ජනවාරි මස 16 වැනි දින අංක 1428/1 දරන ශ්‍රී *ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ* III කොටස බලන්න.

විල්බට් තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
සොරණාතොට.

2006 ජනවාරි මස 10 වැනි දින,
සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
සොරණාතොට.

### උපලේඛනය

| | | |
|---|---|---|
| *දිස්ත්‍රික්කය* | : | බදුල්ල |
| *ප්‍රාදේශීය ආ. නි. කොට්ඨාසය* | : | සොරණාතොට |
| *ගමේ නම* | : | නාගොල්ලාගම, එගොඩවෙලගම, යටිලැලිගම |
| *මූලික සැලැස්මේ අංකය* | : | 178, 179, 84 |
| *අතිරේඛය* | : | 33, 12, 13, 19, 06 |
| *කැබලි අංකය* | : | 210, 211, 212,, 256, 257, 258, 259, 272, 738, 739, 740, 741, 742, 743, 744, 745, 746, 747, 748, 749, 750, 751, 752, 753, 754, 755, 756, 757 |

## 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වෙනි වගන්තිය යටතේ දැන්වීම

එන් 23.

මගේ අංකය : සො/ඉ/1/5/82.

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම් රජයට ලබා ගැනීමට බලපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා වර්ෂ 2005 ක්වූ දෙසැම්බර් මස 12 වැනි දින අංක 1425/17 දරන *ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ* III කොටස බලන්න.

විල්බට් තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
සොරණතොට.

2005 දෙසැම්බර් මස 26 වැනි දින,
සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| *දිස්ත්‍රික්කය* | : | බදුල්ල |
| *ප්‍රා. අ. නි. කොට්ඨාසය* | : | සොරණාතොට |
| *ගම* | : | උඩලඇලේගම |
| *මූලික සැලසුම් අංකය* | : | 88 |
| අතිරේඛයේ අංක | : | 37 |
| කැබලි අංකය | : | 395, 396, 397, 398, 399, 400, 401, 402, 403, 404, 405, 406, 407, 408, 409, 410, 411, 412, 413. |

## 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

එන් 24

මගේ අංකය : සො/ඉ/1/5/83.

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම් රජයට ලබා ගැනීමට බලාපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා වර්ෂ 2006 ක් වූ පෙබරවාරි මස 03 වැනි දින අංක 1430/30 දරන *ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ* III කොටස බලන්න.

විල්බට් තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
සොරණාතොට.

2006 ජනවාරි මස 31 වැනි දින,
සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
සොරණාතොට.

### උපලේඛනය

| | | |
|---|---|---|
| *දිස්ත්‍රික්කය* | : | බදුල්ල |
| *ප්‍රාදේශීය ආ. නි. කොට්ඨාසය* | : | සොරණාතොට |
| *ගම* | : | අ. ග. පි. 178 |
| *අතිරේඛ සැලැස්මේ අංකය* | : | 32, 36 |
| කැබලි අංක | : | 723, 724, 725, 726, 727, 728, 729, 730, 731, 732, 733, 734, 735, 736, 738. |

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

## ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය

(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද්දකි)

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය

(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද්දකි)

ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයන්ට අදාල පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින රජයේ මුද්‍රණ ආයතනය එම ක්ෂේත්‍රයට අදාල දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැපවී කටයුතු කරයි.

වර්ෂ 1984දී පාර්ලිමේන්තු ආඥා පනතක් මගින් ස්ථාපනය කරන ලද මෙම ආයතනය මුද්‍රණ සහ ග්‍රැෆික් ක්ෂේත්‍රයට අදාල පහත සඳහන් පාඨමාලා අප්‍රේල් මාසයේදී ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් පවත්වනු ලබන පහත සඳහන් පාඨමාලාවන්ට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මෙම පාඨමාලාවන් මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ පවතින ඉහල රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකසා ඇත.

(1) පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පරිගණක ආශ්‍රිත මුද්‍රණය (Certificate Course in Computer Typesetting & Desk Top Publishing)

ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තු වන නවකයන් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි. පරිගණක ආධාරයෙන් අකුරු ඇමිණීම පිළිබඳව පුළුල් අවබෝධයක් මින් ලබාදෙන අතර පරිගණක දැනුමත් මුල සිටම පරිගණක භාවිතය සහ මෘදුකාංග අධ්‍යයනය (Computers and Software applications) පිළිබඳව මනා දැනුමක් හා සිත්තම් නිර්මාණය පිළිබඳ මූලික අවබෝධයක් ද ලබාදෙන අතර, මෙම පාඨමාලාව හැදෑරීමට අවශ්‍ය පූර්ණ දැනුම (Certificate Course in Graphic Designing) හා අවබෝධය ලබාදෙයි.

| | | |
|---|---|---|
| පාඨමාලා කාලය | - | පැය 144 (මාස 5) |
| මාධ්‍යය | - | සිංහල/ඉංග්‍රීසි |
| ගාස්තු | - | රු. 8,500 |
| දින | - | සතිපතා සහ සති අන්ත සහ සන්ධ්‍යා පන්ති කීපයක් පැවැත්වේ. |

පාඨමාලා අන්තර්ගතය (Course Content)

* Introduction to Computers
* Keyboard Training & Fonts
* Word Processing using MS Word
* Page Make-up methods using Adobe Pagemaker
* Introduction to Scanning and Image Manipulation
* Introduction to Vector Graphic Applications
* Page Make-up methods using Quark Xpress
* Introduction Internet

මෙම පාඨමාලාවන්ට ඇතුලත්වීමට ඇති ඉඩකඩ සීමාසහිත නිසා සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව තෝරාගනු ලබන අපේක්ෂකයන්ට පමණක් පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලැබේ. පාඨමාලා සාර්ථකව නිම කරන සිසුන්ට රජය පිළිගත් සහතිකයක් පිරිනැමේ.

*විමසීම්* :

ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08,
ටෙලිෆෝන් : 2686162/2679791 ෆැක්ස් : 2686162